# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,392 - 2024 ජූලි මස 05 වැනි සිකුරාදා - 2024.07.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 200 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 202 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ජූලි මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මීගමුව දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : 3493/උකස්

කන්දෙ ගෙදර කෝරාළලාගේ ලලිතා ඉන්දුමතී,
අංක 272/ඒ,
පහළ කඳවල, තිඹිරිගස්කටුව.
(මියගිය කන්දෙගෙදර කෝරළලාගේ සීලදාස ගේ අන්තිම කැමති පත්‍රයක් රහිත බූදලයේ අද්මිනිස්ත්‍රාසි බලකරු)

......................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. කන්දෙ ගෙදර කෝරළලාගේ මල්ලිකා ප්‍රේමකාන්ති, මරදගහමුල පාර, බඩල්ගම.
02. කන්දෙ ගෙදර කෝරාළලාගේ රවිද ශෙහාන් මධුශංක,
03. කන්දෙ ගෙදර කෝරාළලාගේ ශෂිකා ශෙහානි මධුෂිකා.

දෙදෙනාම අංක 124, මීරිගම හරහා (ගොවිපල ඉදිරිපිට), වල්පිට.

..................*විත්තිකරුවන්.*

ඉහත අංකය දරන නඩුවේ වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 08 වැනි දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාර ව විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරු වෙත අයකර ගන්නට කියා නියම කොට තීන්දු ප්‍රකාශය කරන ලද රුපියල් නව ලක්ෂ පන් දහසක (රු. 905,000) මුදල ද, පැමිණිල්ලේ දින සිට එනම් 2012.08.15 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය එනම් 2019.11.08 වැනි දින දක්වා මුල් මුදල එනම් ඉහත කී රුපියල් නව ලක්ෂ පන් දහසක (රු.905,000) මුදල මත 12% වාර්ෂික පොළිය ද, එකී සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් එකී සම්පූර්ණ මුදල මත නෛතික පොළිය ද මේ දක්වා ඉහත නම සඳහන් විත්තිකරුවන් විසින් ගෙවා නොමැති බැවින් මෙම නඩුවේ ඇස්කිසි ක්‍රියාවේ යෙදවීමේ බලපත්‍රයක් නිකුත් කර අධිකරණයෙන් නැවත වැඩි දුරටත් ආඥාවක් ලැබෙන තෙක් මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ යම් ලෙසකින් පැවරීම අන්සතු කිරීම හෝ වැය බරකට යටත් කිරීම, ඒ සම්බන්ධයෙන් යම් ලේඛන ඉදිරිපත් කිරීම හෝ ලියාපදිංචි කිරීම හෝ උපදෙස් දීම එකී විත්තිකරුවන් හට තහනම් කර එයින් වළක්වන ලද හෙයින් සහ එයින් හෝ ඉන් කොටසක් මුදලට හෝ ත්‍යාග වශයෙන් අන් ක්‍රමයකට ලබා ගැනීම සියල්ලන්ට ම තහනම් කරන ලද හෙයින්,

**වර්ෂ 2024 ක් වූ ජූලි මස 30 වැනි දින පෙ. ව. 10.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.**

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිළෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද එවෙලේ ම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

ගැනුම් මිලෙන් 75% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, අලුත්කුරු කෝරළයේ, දූනගහ පත්තුවේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අගලෙගෙදර පිහිටි අගලේගෙදරවත්ත නමැති ඉඩමේ වර්ෂ 2002 ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින සහ 07 වැනි දිනයන්හි ජේ. කේ. එන්. එස්. ජයකොඩි බලයලත් මානක තැන විසින් කොටස් කරන ලද අංක 453 දරන පිඹුරේ බෙදුනු අංක 02 දරන ඉඩම් කොටසට මායිම්:

උතුරට : අංක 13 දරන කොටස ද,
නැගෙනහිර : ඒ. කේ. ප්‍රේමදාසට අයිති ඉඩම ද,
දකුණට : අංක 03 දරන කොටස සහ පාර ද,
බස්නාහිරට : අංක 01 දරන කොටස ද

මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විස්සක් (අ. 01, පර්. 20) විශාල ඉඩම සහ ඒ මත ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සැම සියලු දේ වේ.

අධිකරණයේ අණ පරිදි,

දිසා අධිකරණය - මිනුවන්ගොඩ.

වර්ෂ 2024 ක් වූ මැයි මස 28 වැනි දින දී ය.

07-209

---

**මහනුවර දිසා අධිකරණයේ දී ය**

**පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

නඩු අංකය : එම්. බී. 93/2019
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
ඇස්ක්‍රීසි අංකය : 62/24

මහනුවර දළදා වීදියේ අංක 01 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. (කලින් සීමා සහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ) අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

*..................පැමිණිලිකරු.*

*එදිරිව*

1. පොට්ටියුඩ් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
   අංක 555/8, ගොහාගොඩ පාර,
   පොල්වත්ත, කටුගස්තොට.

2. ශ්‍රියාදේවි රාජාරාම විජයගුණරත්න,
   අංක 555/8, ගොහාගොඩ පාර,
   පොල්වත්ත, කටුගස්තොට.

3. සමරවීර මුදලිගේ එරේන්ද්‍ර ධනුෂ්ක විජයගුණරත්න,
   අංක 555/8, ගොහාගොඩ පාර,
   පොල්වත්ත, කටුගස්තොට.

*................විත්තිකරුවන්.*

වර්ෂ 2021 ක් වූ අගෝස්තු මස 03 වැනි දින මෙම නඩුවේ සමථ තීන්දු ප්‍රකාශයට අනුව ඉහත නම් සඳහන් වන විත්තිකරුවන්ගෙන් I එක්ව සහ වෙන් වෙන්ව රු. 961,389.42 ක මුදල මත 2019.04.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වර්ෂයකට 16.5% බැගින් පොළිය ද සමග

II සහනය අනුව රු. 16,56,875.40 ක මුදල ඒ සඳහා 2019.04.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 16.5% බැගින් පොළිය ද, ඇස්ක්‍රිසි ක්‍රියාත්මක කිරීමට සිදු වුවහොත් ඒ සඳහා වැයවන සියලු වියදම් ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට 2024 මැයි මස 22 වැනි දින මා විසින් තහනමට ගෙන ඇති 02, 03 විත්තිකරුවනට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 09 වැනි දින ප.ව. 2.00 ට**

ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් දේපළ පිහිටි, මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව, කුළුගම්මන, සියපත්තු හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්වත්ත, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොන්ඩදෙනිය ගමෙහි පිහිටි 'ගංගොඩ පොල්වත්ත *හෙවත්* ගඟ ගාව පොල්වත්ත' නමැති ඉඩම පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, කුළුගම්මන, සියපත්තු හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පොල්වත්ත, ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ කොන්ඩදෙනිය ගමෙහි පිහිටි ගංගොඩ පොල්වත්ත *හෙවත්* ගඟ ගාව පොල්වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. දොල්වෙල සකස් කරන ලද 1985.06.15 දිනැති අංක 1770/ඒ, දරන පිඹුරේ ලොට් අංක 01 ඒ දරන, ඉඩමට මායිම්, උතුරට : කේ. පී. සෝමරත්නට අයිති එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : ලොට් 01 බී වලින් ද, දකුණට ලොට් 07 සහ පාරෙන් ද, බස්නාහිරට : වලාල රජමහා විහාරයට අයිති ඩිංගිරිය දෙණිය කුඹුර යායෙන් ද, මායිම් වූ පර්චස් විස්ස (පර්. 20) ක් විශාල ඉඩම තුළ පිහිටි සියලුදේත් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ T63/16 දරන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු, විසින් විකුණුම් මිලෙන් 25% ක් මුදලින් ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත මහනුවර දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ද මුදලින් ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මහනුවර.

වර්ෂ 2024 ක් වූ ජුනි මස 19 වැනි දින,
මහනුවර දිසා අධිකරණයේ දී ය.

07-306

---

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ගාමිණී ලොකුගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

*(අ)* බුදුරජාණන්වහන්සේ දේශනා කරන ලද නිර්මල උතුම් වූ ශ්‍රී සද්ධර්මය චිරාත් කාලයක් රැක ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම, ආරක්ෂා කිරීම, එයට අවශ්‍ය ශක්තිය, ධෛර්යය හා කැපවීම ලබා දීම ;

*(ආ)* තෙරුවන්ගේ ආරක්ෂාව සලසමින් බුදු දහමට අනුව දාන, ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා තුළින් සහ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළින් ජීවිතය හරිමගට යොමු කරවීම, ඒ අනුව කටයුතු කරමින් සේවා දායකත්වය සහ උපදෙස් ලබා දීම ; *සහ*

*(ඇ)* සුචරිතවත් ජන සමාජයක් බිහි කිරීම උදෙසා සංගමයේ සාමාජිකත්වය ද ඇතුළුව සියලුම දෙනා පුණ්‍ය කටයුතු සඳහා සහභාගි කරවීම, දායකත්වය ලබා දීම හා ධර්ම මාර්ගයට යොමු කිරීම ;

යනාදිය වේ.

ගාමිණී ලොකුගේ,
කොළඹ දිස්ත්‍රික්
පාර්ලිමේන්තු මන්ත්‍රී.

07-356

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2024 වර්ෂය** | | | | | |
| **ජූලි** | 2024.07.05 | සිකුරාදා | 2024.06.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.07.12 | සිකුරාදා | 2024.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.19 | සිකුරාදා | 2024.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.26 | සිකුරාදා | 2024.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2024.08.02 | සිකුරාදා | 2024.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.09 | සිකුරාදා | 2024.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.16 | සිකුරාදා | 2024.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.23 | සිකුරාදා | 2024.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.30 | සිකුරාදා | 2024.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2024.09.06 | සිකුරාදා | 2024.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.13 | සිකුරාදා | 2024.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.20 | සිකුරාදා | 2024.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.27 | සිකුරාදා | 2024.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.